**මීගහකිවුල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

-----------------------------------

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 26 වන දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර,එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 21 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 24 දිනද,සභාපතිවරයාට යවා ඇත.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

**(අ) <u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් දිනට තොග 31 තුල, භාවිතාකර ඉවත් කරනලද වාහන ටයර් 20 කම්ලදී ගත් වටිනාකම රු.1,752,452 ක් ඇතුලත් කර තිබුණි. | ගිණුම් වලින් ඉවත් කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදි නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයහිමි රු.1,769,196 ක් වුවද එය රු.1,820,141 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදි නිවැරදි කිරිමට කටයුතු කරමි. |

**(ආ) <u>නොසැසදුනු ගිණුම්</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මූල්‍ය ප්‍රකාශන අනුව රු.9,702,480 ක් හා උපලේඛන අනුව රු.9,867,305 ක් වුයෙන් රු.164,825 ක වෙනසක් විය. | ගිණුම් ශේෂ සැසඳිය යුතුවේ. | ඉදිරි වර්ෂයේදි නිවැරදිව ගිණුම්ගත කිරිමට කටයුතු කරමි. |

(ඇ) විගණනය සඳහා සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු. 54,128,334 ක් වූ ගිණුම් විෂයයන් 03 ක ඔප්පු, පිඹුරුපත් , පැවරුම් නියෝග, ස්ථාවර වත්කම් ලේඛනය, තක්සේරු වාර්තා, විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | අවශ්‍ය සාක්ෂි ගොනු කර ගැනීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම්

නීතී,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

| | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 126(vii)ඊ වගන්තිය හා 1988 අගෝස්තු 23 දිනැති අංක 520/7 දරන ගැසට් නිවේදනයේ සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වන ඡේදය | දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කරන ස්ථාන හඳුනාගෙන ගාස්තු අය කරගැනීම 2017 වර්ෂයෙන් පසුව සිදුකර නොතිබුණි. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. | මේවනවිට දැන්වීම් ගාස්තු අය වෙමින් පවති. |
| (ආ) | 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | වර්ෂ 05 කට වරක් බදුකුලී තක්සේරු කර ගිවිසුම් වලට එළඹිය යුතු වුවද, කඩ කාමර 22 ක් සඳහා 2011 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන අයකිරීම් සිදුකිරිම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට ජූනි දක්වා රු.375,180 ක මුදලක් සභාවට අහිමිවී තිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුවේ. | හිඟ මුදල් සඳහා ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගෙන ඉදිරි කටයුතු කිරීමට අපේක්ෂා කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.703,243 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,649,255 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තු ගත ආදායම්,බිල් කළ ආදායම් ,රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,850,000 | 1,418,305 | 975,673 | 442,632 | 850,000 | 1,199,437 | 896,209 | 303,228 |
| (ii) | කුලී | 3,540,240 | 3,023,412 | 2,973,467 | 49,945 | 2,487,612 | 2,415,812 | 1,904,729 | 511,083 |
| (iii) | වෙනත් ආදායම් | 4,100,000 | 4,100,000 | - | 4,100,000 | 3,500,000 | 3,500,000 | 407,158 | 3,092,842 |
| | එකතුව | 9,490,240 | 8,541,717 | 3,949,140 | 4,592,577 | 6,837,612 | 7,115,249 | 3,208,096 | 3,907,153 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර 02 කට අධික කාලයක සිට පැවත එන ආදායම් ණය ගැතියෝ රු.12,933,305 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ ණය ශේෂ අය කරගත යුතුවේ. | පිළිගනිමි. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.2,600,000 ක් හා හිඟ මුද්දර ගාස්තු රු.1,500,000 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ උසාවි දඩ හා හිඟ මුද්දර ගාස්තු අය කරගත යුතුවේ. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු උසාවි දඩ 2019 සැප්තැම්බර් දක්වා හා හිඟ මුද්දර ගාස්තු 2019 මැයි මස දක්වාත් අය කරගෙන ඇත. ඉතිරිය අය කර ගැනීමට කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය 3 දේශීය සභා පනතේප්‍රා, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය,පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ .

(අ) <u>අතුරු ව්‍යවස්ථා</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශිය සභා පනතේ 126 වගන්තිය අනුව ප්‍රධාන කාරණා 30 ක් ඉටුකිරිම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් අතුරු ව්‍යවස්ථා පනවා හෝ වැළඳගෙන නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවාගෙන නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුවේ. | සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීමට අදාලව සභා තීරණය ගෙන ඇත. ගැසට් කිරිමේ ඉදිරි කටයුතු කඩිනම් කරමි. |

(ආ) <u>ක්‍රියාකාරි සැලැස්ම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | මෙම වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කරමින් පවති. |

(ඇ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද,සභාවට අදාළ කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමට ඉදිරියේදි කටයුතු කරමි. |

**3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2014 හා 2015 වර්ෂවලදී ඉදිකිරිම් කර්මාන්ත සඳහා ලබාදී තිබුණු රු.494,051 ක අත්තිකාරම් මුදල් පියවා නොතිබුණු අතර,අදාල කර්මාන්ත නිම කරද නොතිබුණි. | කර්මාන්ත නිමකර අත්තිකාරම් පියවා ගත යුතුවේ. | ලබාදෙන ලද අත්තිකාරම් මුදල් සම්බන්ධව විෂය නිලධාරින්ගේ අවධානය යොමුකර ඉදිරි කටයුතු කර ඇත. |
| (ආ) | වසර 02 කට අධික කාලයක සිට පැවත එන ණයහිමියෝ රු.1,820,141 ක් නිරවුල් කර නොතිබුණි. | ණයහිමි ශේෂ නිරවුල් කළ යුතුවේ. | පිළිගනිමි. |

3.3 **<u>වත්කම් කළමනාකරණය</u>**

3.3.1 **<u>ඌන උපයෝජිත වත්කම්</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් රු.7,900,000 ක ගල්රෝල සහ රු.255,000 ක කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය සභාවට ආදායම් උපයාගත හැකි ආකාරයට උපයෝජනය කර නොතිබුණි. | ආදායම් උපයාගත හැකිවන පරිදි උපයෝජනය කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදි ආදායම් උපයාගත හැකි ආකාරයට ක්‍රමවේදයක් ගොඩනැගීමට අපේක්ෂා කරමි. |

3.4 **<u>නිෂ්ක්‍රිය වත්කම්</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඩොලමයිට් ව්‍යාපෘතිය සඳහා රු.533,100 ක් වැය කර ඉදිකල ගොඩනැගිල්ල වසර 16 ක කාලයක් නිෂ්ක්‍රියව පැවතුනි | ඵලදායි කාර්යයක් සඳහා භාවිතයට ගත යුතුවේ. | ඉදිරියේදි සභාවට යොමුකර ඵලදායි ව්‍යාපෘතියකට යොදා ගැනීමට කටයුතු කරමි. |

3.5 **<u>මානව සම්පත් කළමනාකරණය</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 03 කට අදාළව සිටි සේවක අතිරික්තය 4 ක් සහ තනතුරු 04 කට අදාලව සේවක පුරප්පාඩු 05 ක් පැවතුනි | කාර්ය මණ්ඩලයේ අතිරික්ත හා පුරප්පාඩු සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. |

4. **<u>ගිණුම් කටයුතු භාවය හා යහපාලනය</u>**

4.1 **<u>විගණන හා කළමනාකරණ කමිටු</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි. | අවම වශයෙන් කාර්තුවකට වරක් වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | මෙම වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටු 04 ක් පැවැත්වීමට කටයුතු කරන බව |